04

00028

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

වර්ෂ අවසාන පරීක්ෂණය - 2017/18

**LWU4325/ LLU6717**- ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය

කාලය – පැය තුනයි (03)

| | |
|---|---|
| දිනය – 2020 පෙබරවාරි 19 | වේලාව - ප.ව.1.30 - ප.ව.4.30 |

මුලු ප්‍රශ්න සංඛ්‍යාව - 08

ප්‍රශ්න පහකට **(05)** පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. '... එහෙත් මේ නිල එකඟතාවය පසුපස ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම්වල සැබෑ තත්වය පිළිබඳ වූ ගැඹුරු වූ ද, මුල් බැසීන ලද්දා වූ ද නොඑකඟතාවයක් සැඟවී පවතී. එක් අන්තයක, මෙකී අයිතිවාසිකම් වටිනාකම් ධූරාවලිය අතින් ගත්තද, කාලානුක්‍රමික අර්ථයෙන් ගත්ත ද සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්වලට වඩා ඉහලින් පිහිටන බවට වූ අදහස ඇත. සා දුකින් පෙලෙන, අකුරු නූගත් අයට භාෂණයේ නිදහසට ඇති අයිතියේ තිබෙන ප්‍රයෝජනය කුමක්ද? අනෙක් අතට, ආර්ථික හා සමාජ අයිතිවාසිකම් (එහි සැබෑ අර්ථයෙන් ගත් කල) කිසිසේත්ම අයිතිවාසිකම් ගණයෙහිලා සැලකිය නොහැකි බවට වූ අදහස ඇත.'

   - Henry J Steiner, Philip Alston and Ryan Goodman. (2008). *International Human Rights in Context*. 3rd edition. Oxford: Oxford University Press, p. 237

අන්තර්ජාතික අයිතිවාසිකම් පනත (International Bill of Rights) තුල සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සහ ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් යන අයිතිවාසිකම් ප්‍රභේද දෙක පිළිගැනීමට ලක්වී තිබෙන ආකාරය සංසන්දනය හා විසංසන්දනය (compare and contrast) කරමින් ඉහත දැක්වෙන ප්‍රකාශය පිළිබඳ

අදහස් දක්වන්න. සියලු ආකාරවල මිනිස් අයිතිවාසිකම් වෙන්කල නොහැකි බව, අන්තර්සම්බන්ධිත බව හා අන්‍යොන්‍ය වශයෙන් එකිනෙක මත රඳා පවතින බවට සැලකෙන්නේ මන්දැයි සැබෑ ජීවිතයේ උදාහරණ ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

2. ජාත්‍යන්තර නීතිය තුල තනිපුද්ගල අපරාධ වගකීම (individual criminal responsibility) පිලිබඳ සංකල්පය පරිණාමය වූ ආකාරය පැහැදිලි කොට අන්තර්ජාතික අපරාධ අධිකරණ සම්මුතිය (රෝම සම්මුතිය) (1998) විසින් එම සංකල්පය බලාත්මක කොට තිබෙන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න. ජාත්‍යන්තර අපරාධ සඳහා වගවීම සහතික කිරීම ගෝලීය වශයෙන් වැදගත් අවශ්‍යතාවයක් වන්නේ මන්දැයි පහදන්න.

(ලකුණු 20)

3. 'විශ්වීය සිද්ධාන්තයන් හෝ මූලධර්ම නිර්මාණය කිරීමට උත්සාහ කිරීම - එසේ නැතිනම් යම් සිද්ධාන්තයක් හෝ මූලධර්මයක් විශ්වීය යමක් ලෙස හුවා දැක්වීමට වෑයම් කිරීම තුල අසමාන වූ විශ්වයේ විවිධත්වය විනාශ වී යාමේ හෝ යටපත් කොට දැමීමේ අවදානම ගැබ් වී තිබේ. විශ්වීය අදාලත්වය පිලිබඳ කියාපෑම නොවිය හැක්කක් නොවේ නම්, අවම වශයෙන් බෙහෙවින් ගැටලුසහගත ප්‍රස්තුතයකි. මානව ගරුත්වය යන්නෙහි අන්තර්ගතය කවරක් ද යන්න පිලිබඳ අන්තර්ජාතික මට්ටමේ එකඟතාවයක් ඇති කරගැනීම සඳහා දරනු ලබන ඕනෑම උත්සාහයක් උදෙසා අදාල කාර්යයෙහි සංකීර්ණතාවය පිලිබඳ මනා වැටහීමක් සහිතව, නැවුම් වූ ද විවෘත මනසකින් සිදු කෙරෙන්නා වූ ද ප්‍රවේශයක් අවශ්‍ය වන්නේ එම නිසාය.'

- Makau Mutua. (2002). *Human Rights: A Political and Cultural Critique*. Philadelphia: Pennsylvania University Press.

මානව හිමිකම්වල විශ්වීය ස්වභාවය පිලිබඳ කියාපෑම සහ සංස්කෘතික සාපේක්ෂතාවාදය මත පදනම් වූ ප්‍රති-කියාපෑම්වල සන්දර්භය තුල ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. නූතන මානව හිමිකම් රාමුව යුරෝ-

කේන්ද්‍රීය වටිනාකම් පිලිබිඹු කරන බවත්, බටහිර නොවන සංස්කෘතීන්වල ආචාරධාර්මික වටිනාකම් ඒ තුල ප්‍රමාණවත් ලෙස නිරූපණය නොවන බවත් ඔබ සිතනවාද? උදාහරණ ගෙන හැර දක්වමින් ඔබගේ පිලිතුර සනාථ කරන්න.

(ලකුණු 20)

4. ෆෙඩරේසියාව යනු පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් තිබෙන සංවර්ධනය වෙමින් පවතින රටකි. මෙම රට තුල දශක ගණනාවක් තිස්සේ මහජන නියෝජිත ආයතන ක්‍රියාත්මක වූවද එම ආයතන තුල කාන්තා නියෝජනය ඉතාම අවම බව විවේචකයින් විසින් නිරීක්ෂණය කරන ලද කරුණකි. මෙම කරුණ ප්‍රශ්නයක් ලෙස හඳුනාගත් කාන්තා ක්‍රියාකාරිනියන් කිහිප දෙනෙක් පාර්ලිමේන්තුවේ සහ වෙනත් නියෝජිත ආයතනවල කාන්තා නියෝජනය ඉහල නැංවීමේ අරමුණින් කෝටා ක්‍රමයක් හඳුන්වා දීමේ අදහස ප්‍රවර්ධනය කිරීම සඳහා සිය මූලිකත්වයෙන් ‘කාන්තා වේදිකාව’ නමින් සංවිධානයක් පිහිටුවා ගත්හ. ඒ අනුව සෑම නියෝජිත ආයතනයකම සියයට විසි පහක ආසන ප්‍රමාණයක් කාන්තාවන් සඳහා වෙන් කල යුතු බවට ඔවුහු යෝජනා කලහ. මෙමගින් සිය අපේක්ෂක ලැයිස්තුවල සැලකිය යුතු ඉඩක් කාන්තාවන්ට අනිවාර්යයෙන්ම ලබාදීමට දේශපාලන පක්ෂවලට සිදුවනු ඇතැයි ඔවුහු කල්පනා කලහ. කෙසේ වූවද, එම රටේ දේශපාලන පක්ෂයක් වූ ‘කහ හවුල’ නම් සන්ධානය මෙලෙස කාන්තාවන්ට වරණීය සැලකුම් දැක්වීම කාන්තාවන් හා පුරුෂයින් අතර සමානාත්මතාවය පිලිබඳ අදහස උල්ලංඝනය කරන්නක් බවට චෝදනා කරමින් උද්ඝෝෂණය කරන්නට පටන් ගත්තේය. ෆෙඩරේසියාව තුල කාන්තාවන්ට ඡන්දය ඉල්ලීම තහනම් කරන කිසිදු නීතියක් නොමැති බව පෙන්වා දුන් එම පක්ෂය යම් කාන්තාවකට අවශ්‍ය නම් ඇයට මැතිවරණවලට නිදහස්ව ඉදිරිපත් වීමට නීතිමය අවසරය තිබෙන බවත්, එම සන්දර්භය තුල කාන්තාවන්ට විශේෂ කොට සැලකීම පුරුෂයින්ට එරෙහිව වෙනස් කොට සැලකීමක් වන බවටත් තර්ක කලේය.

ආසන සඳහා කෝටාවක් ලබාගැනීමේ ඉල්ලීම සාධාරණීකරනය කරමින් ආණ්ඩුව වෙත වාර්තාවක් සැපයීම සඳහා ‘කාන්තා වේදිකාව’ ඔබව නීති උපදේශකවරයෙක් ලෙස පත් කොට ඇත. ඔබ සකසනු ලබන වාර්තාවේ ඇතුලත්

මූලික කරුණු ඉදිරිපත් කරන්න. ඔබගේ ස්ථාවරය ඉදිරිපත් කරන විට දේශීය හා ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රතිපාදන වෙත අවධානය යොමු කල යුතුය. ෆෙඩරේසියාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව 1978 ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට සමාන බවත්, එම රට සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය සහ කාන්තාවන්ට එරෙහි සියලු ආකාරවල වෙනස් කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය ඇතුලු සියලු ප්‍රධාන ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතීන් අපරානුමත කොට ඇති බවත් සලකන්න. (ලකුණු 20)

5. රාජ්‍යයන් අන්තර්ජාතික මානව හිමිකම් සම්මුතීන් අපරානුමත කරන නමුත් බොහෝ විට දේශීය මට්ටමේ දී ඒවා ක්‍රියාත්මක කිරීම නොසලකා හැරීමට පෙලඹේ. රාජ්‍යයන් මානව හිමිකම් සම්මුතීන්වල ප්‍රතිපාදනවලට ගරු කරන බව සහතික කිරීම සඳහා පිහිටුවන ලද විස්තීර්ණ යාන්ත්‍රණ පද්ධතියක් ජාත්‍යන්තර මානව හිමිකම් නීති රෙජිමය තුල අන්තර්ගත වේ. කෙසේ වූවද, සිය වගකීම් පැහැර හරින රාජ්‍යයන්ට දඬුවම් පැනවීමට මෙම යාන්ත්‍රණ සතුව හැකියාවක් නොමැති නිසා මේවාවල සඵලතාවය බොහෝ දුරට රැඳී පවතින්නේ රාජ්‍යයන් කොතෙක් දුරට ස්වේච්ඡාවෙන් තමන්ගේ මානව හිමිකම් බැඳියාවන් ඉෂ්ට කිරීමට සූදානම් ද යන කාරණය මතය.

ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් නිරීක්ෂක ආයතනවල (Human Rights Monitoring Bodies) බලතල හා කාර්යභාරය කෙරෙහි අවධානය යොමු කරමින් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 20)

6. '.. සියලුම පාර්ශවකාර-රාජ්‍යයන් සෑම සියලු දරුවෙක්ගේම පැවැත්ම හා සංවර්ධනය සිය උපරිම ශක්ති ප්‍රමාණයෙන් තහවුරු කිරීම සඳහා කටයුතු කරන බවක් දක්නට නොලැබේ. සෑම සන්දර්භයකදීම පාහේ අපට දක්නට ලැබෙන්නේ ළමයින්ගේ හඬ යටපත් කොට දැමෙන හෝ නොසලකා හැරීමට ලක්වන ආකරයයි. තවමත් දරුවන්ට සලකනු ලැබෙන්නේ රැකවරණය ලැබිය යුතු අක්‍රීය විෂයක් ලෙසටය. වහල්භාවය, කුට්ටනය, බලහත්කාරයෙන් වැඩ ගැනීමේ ඉතාම

දූෂ්ට ආකාරවලට භාජනය කිරීම, ගෘහස්ථ වහල්භාවය, ලිංගික වහල්භාවය හා බලහත්කාරයෙන් විවාහ කරදීම ආදී වූ අනේක විධ අපරාධවලට ළමුන් විශේෂයෙන් නිරාවරණය වෙති'.

- මිෂෙල් බැචලට් ( මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්) 2019 ජනවාරි 14 වන දා පැවැති ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුවේ 80 වන සැසිවාරයේ දී සිදුකරන ලද ආරම්භක ප්‍රකාශයෙනි.

සමකාලීන යුගයේ ළමුන් සඳහා ගෞරවාන්විත ජීවිතයක් තහවුරු කිරීමෙහිලා මානව හිමිකම් ප්‍රජාව මුහුණ දෙන අභියෝග සමහරක් ඉහත ප්‍රකාශය තුළ අන්තර්ගත වේ. හුදෙක් රැකවරණය ලැබිය යුතු අක්‍රීය විෂයක් ලෙස සලකනු වෙනුවට, අයිතිවාසිකම් හිමි කොට්ඨාශයක් ලෙස ළමුන් සැලකීම මගින් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය (1989) කෙතරම් දුරට ළමුන් සඳහා යහපත් අනාගතයක් ඇති කිරීම වෙනුවෙන් වූ රාමුවක් සපයන්නේ දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

7. වර්සෝ ජනරජය යනු රජයේ හමුදා සහ 'වර්සෝ විමුක්ති බලකාය' යනුවෙන් හඳුන්වනු ලබන සන්නද්ධ කැරලිකාරී සංවිධානය අතර කෙරෙන සිවිල් යුද්ධය නිසා මහත් ව්‍යසනයට පාත්‍ර වී තිබෙන රාජ්‍යයකි. ලියොන් යනු කැරලිකරුවන්ගේ බලපෑමට ලක්වී තිබෙන ප්‍රදේශයක ජීවත් වූ සුළු පරිමාණ ව්‍යාපාරිකයෙකි. 2013 ජනවාරි මාසයේදී, ආරක්ෂක මුරපොලක දී කැරලිකාර භටයින් සමග සම්බන්ධතා පැවැත්වී යැයි සැක පිට ලියොන් මිලිටරි පොලිසියේ අත්අඩංගුවට පත්විය. නිල නොවන රැඳවුම් ස්ථානයකට ඔහුව ගෙන යනු ලැබුණු අතර මාස තුනක කාලයක් එහි රඳවා තැබිණ. මෙ කාලය අතරතුර සිය ඥාතීන් හා නීතිඥවරයෙක් මුණ ගැසීමට අවස්ථාවක් ඔහුට ලබා නොදුන් අතර මහේස්ත්‍රාත්වරයෙක් අභිමුවට ඔහුව පැමිණවීමක් ද සිදු වූයේ නැත. තවද, රැඳවුම් භාරයේ සිටිය දී දෛනිකව ලියොන් පහර දීම්වලට භාජනය විය. හෙතෙම වර්සෝ විමුක්ති බලකායේ සාමාජිකයෙක් බවට පිළිගන්නා පාපොච්චාරණයකට අත්සන් තබන ලෙස එහි දී ලියොන්ට බල කෙරිණ. එම පාපොච්චාරණය ලබාගැනීමෙන්

පසු ලියොන්ව මහේස්ත්‍රාත් උසාවියට ඉදිරිපත් කෙරුණු අතර රජය විසින් පවත්වාගෙන යන බන්ධනාගාරයක ඔහුව රඳවන ලෙස එහි දී මහේස්ත්‍රාත් අධිකරණය නියෝග කලේය. තමා රැඳවුම්භාරයේ සිටිය දී පහර කෑමට ලක්වූ බව ලියොන් මහේස්ත්‍රාත්වරයාට දැනුම් දුන්න ද එතුමා ඒ පිලිබඳ එතරම් සැලකිල්ලක් දැක්වූයේ නැත. පසුව ලියොන්ට එරෙහිව මහාධිකරණයේ අධි චෝදනා ගොනු කරන ලදී. ඒ වෙනත් කරුණු අතර සැකකරුවන් රැඳවුම්භාරයේ සිටිය දී කරනු ලබන ප්‍රකාශයන් අධිකරණමය සාක්ෂි ලෙස පිලිගැනීමට අවසර ලබාදෙන ප්‍රතිපාදන සහිත ආන්දෝලනාත්මක නීතියක් වන *ත්‍රස්තවාදය මැඩපැවැත්වීමේ පනත* යටතේය. නඩු විභාගයේ දී ලියොන් වැරදිකරු බව තීන්දු වී විසි වසරක සිර දඬුවමක් නියම කෙරුණු අතර ඔහුට එරෙහි නඩුව විශාල වශයෙන් පදනම් වී තිබුණේ ඔහුගේම පාපොච්චාරණය මතය. මහාධිකරණ තීන්දුවට එරෙහිව හෙතෙම ඉහල අධිකරණවලට කල අභියාචනා නිෂ්ප්‍රභා වූයේය.

ස්වකීය අයිතිවාසිකම් උල්ලංඝණය වී තිබෙන බව විශ්වාස කරන ලියොන් ජිනීවා හි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව වෙත පැමිණිලි කිරීමට තමන්ට තිබෙන අවකාශය පිලිබඳව කරුණු විමසා සිටී. දේශීය හා ජාත්‍යන්තර මානව හිමිකම් නීති ප්‍රතිපාදන කෙරෙහි අවධානය යොමු කරමින්, ලියොන්ට කවර පදනම් මත එලෙස පැමිණිලි කල හැකිදැයි විස්තර කොට ඔබගේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයා වෙනුවෙන් සාරාංශගත සටහනක් පිලියෙල කරන්න. ඔබ සකසනු ලබන සටහන තුල මානව හිමිකම් කමිටුවේ නිර්දේශවලින් වර්සෝ ජනරජය නීතිමය වශයෙන් බැඳී සිටින්නේද යන කරුණ ද පැහැදිලි කල යුතුය. වර්සෝ ජනරජයේ නිති පද්ධතිය ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය හා සර්වසමාන බවත්, එම රාජ්‍යය සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිලිබඳ ජාත්‍යන්තර සම්මුතිය සහ එහි පලමු වෛකල්පිත සන්ධානය (First Optional Protocol) අපරානුමත කොට ඇති බවත් උපකල්පනය කරන්න. (ලකුණු 20)

8. පහත මාතෘකා අතුරින් <u>දෙකක්</u> තෝරාගෙන ඒ පිලිබඳ රචනා ඉදිරිපත් කරන්න.

   අ) අන්තර්ජාතික මානව හිමිකම් බැඳීම් හීන කිරීම (derogation from international human rights obligations)

ආ) මානව හිමිකම් සහ මූලික අයිතිවාසිකම් අතර සම්බන්ධතාවය

ඇ) ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ වගකීම් පැවරෙන පාර්ශව (duty bearers)

(10×2=ලකුණු 20)

***හිමිකම් ඇවිරිණි***